# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2017

## දීලික්ත නීතිය

### පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01. "බොහෝමයක් රටවල, දීලික්ත හෝ තෝරත පිළිබඳ සිවිල් නඩුකර, මූල්‍යමය වන්දි ලබාගැනීම පිණිස පවතින උපක්‍රමයක් ලෙස මෙන්ම, මහජන නිලධාරීන් සහ ආයතන සතු මහත් වූ වගකීම ප්‍රවර්ධනය කරමින්, යම් වළක්වා ගැනීමේ බලපෑමක් (Deterrent impact) ඇති එකක් යන ද්විත්ත්වයම ඉතා ප්‍රබලව ක්‍රියාවට නංවනු ලැබේ."

(S.W.E. Goonesekera, Fundamental Rights and the Law of Delict, Extracted from Essays in honour of H.L. De Silva P.C., "Human Rights, Human Values and the Rule of Law", Edited by A.R.B. Amarasinghe and S.S. Wijeratna, Legal Aid Foundation Colombo, 2013, P. 52-70)

දීලික්ත / තෝරත නීතියෙහි මූලධර්මවල ක්ෂේත්‍රය සහ අදාළත්වය පුළුල්කිරීම සඳහා, මහජන නිලධාරීන්ගේ හෝ ආයතනවල දීලික්තමය වගකීම උද්ගත වන නඩු, විනිශ්චය කිරීමේදී, අයිතීන් මත පදනම් වූ ප්‍රවේශය (Rights based Approach) දායකව ඇත්තේ කෙසේද යන්න විවේචනාත්මකව විග්‍රහ කරන්න.

02. රවී, ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු සහ අනෙකුත් කාර්මික උපකරණ නිෂ්පාදනය කරනු ලබන "ටෙක්නෝ රූෆින් ප්‍රඩක්ට්ස් ලිමිටඩ්" සමාගමේ හිමිකරුය. එම සමාගමේ වසර 25 කට අධික කාලයක් 'සමාගම් වැඩ පරීක්ෂකවරයෙකු' ලෙස සේවය කළ සමන් නැමැත්තා, පෙනහලු පිළිකාවක් හේතුවෙන් කොළඹ ආරෝග්‍යශාලාවකදී මියගොස් ඇතිබව, රවීගේ කළමනාකරු වන අනිල් විසින් රවීට දන්වා සිටී.



අ.පි.බ.

ඔවුන්ගේ සේවකයන් වෙත සපයනු ලබන ආරක්ෂිත ඇඳුම් සහ ආරක්ෂිත උපාංග වල ගුණාත්මකභාවය පිළිබඳව ලැබෙන පැමිණිලි, දිගින්දිගටම නොසලකා හැරීම, නුවණට හුරුදෙයක් නොවන බවට, අනිල්, රවීට අනතුරු ඇඟවීය. ඊට ප්‍රතිචාර වශයෙන් රවී ප්‍රකාශ කළේ, සමන්ගේ මරණයට හේතුව ඔහුගේ අධික දුම්පානය විය හැකි බවයි.

සමන්ගේ බිරිඳ වන අනුලාට, රවීට එරෙහිව සිවිල් නඩුවක් පැවරීමට දැන් අවශ්‍යව ඇත. නිෂ්පාදන කාර්යය සඳහා භාවිතා කරනු ලබන පිළිකාකාරක ද්‍රව්‍යයන්ගෙන් තම සේවකයන් ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීමට, රවී අපොහොසත්වීම පිළිබඳව ඇය ඔහුව වරදකරු කරයි. ඇය තර්ක කරන්නේ, මීට වසර 05 කට පෙර, සමන් දුම්පානය අත්හළ බවත්, ඇස්බැස්ටෝස් ධූලි වෙත නිරාවරණය වීම සමන්ගේ මරණය සඳහා වන ආසන්නතම හේතුව බවත්ය. සමන්ගේ මරණය නිසා ඇයට සිදුවූ යැපීම් අහිමිවීම, සහවාසය අහිමිවීම මෙන්ම වේදනාව හා පීඩාව (Pain and suffering) යන කරුණු සම්බන්ධයෙන් වන්දි ලබාගැනීමට අනුලාට අවශ්‍යව ඇත. වෛද්‍ය වාර්තා හෙළිදරව් කරන්නේ ඇස්බැස්ටෝස් ධූලි යනු සමන්ගේ මරණය සඳහා දායක වූ එක් හේතුවක් පමණක් වන බවයි. මේ අතර, සමන් කෙදිනකවත් අනුලා සමඟ නීත්‍යානුකූලව විවාහ වී නොසිටි බව, රවී සොයා ගත්තේය.

පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

03. සෑම්, තමාගේ අත්උදව්කරු වූ රාම් සමඟ, රථයක ඉන්ධන ප්‍රවාහනය කරමින් සිටියේය. බීමත් රියදුරකු ධාවනය කළ, ටින් තහඩු ප්‍රවාහනය කරන ලද ට්‍රක් රථයක්, විශාල පිපිරීමක් ඇති කරමින්, නොසැලකිලිමත් ලෙස පැමිණ, සෑම් පැද වූ රථයේ ගැටුණි. බීමත් රියදුරා, සුළු තුවාල සහිතව අනතුරින් දිවිගලවා ගත්තේය. සෑම් සහ රාම් යන දෙදෙනාම, අනතුර නිසා ඇති වූ ලෝහ ද්‍රවවීම හේතුකරගෙන මූලික වශයෙන් දැඩි පිළිස්සුම් තුවාල ලැබූ අතර, ඔවුන් වහාම රෝහල වෙත ගෙන ලදි. සිහිසුන්ව සිටි රාම් සහ සෑම් රැගෙන යමින් සිටි රථය, රෝහලට යන අතරමගදී, විනාඩි 45 ක කාලයක් පුරා විරෝධතා පාගමනකට මැදිවිය. රෝහලට ඇතුළත් කළ වහාම, සෑම් මියගොස් ඇතිබව වෛද්‍යවරයා ප්‍රකාශ කළ අතර, රෝහලට ඇතුළත් කිරීමට ප්‍රමාදවීම සහ අධික පිළිස්සුම් තුවාල ලැබීම සෑම් ගේ මරණයට හේතු වී ඇති බව සඳහන් කළේය. සෑම්ගේ ශරීරයෙන් 60% පමණ ප්‍රමාණයක් පිළිස්සී තිබිණි.

ශරීරයෙන් 35% ක ප්‍රමාණයක් පමණක් පිළිස්සීමට ලක්ව, දිවි ගලවාගත් රාම්, බීමත් රියදුරාට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළේය. අනතුරින් වසර 02 කට පසුව, එකී නඩුව අධිකරණයේ විභාගවෙමින් පවතින අතරතුර, රාම් මිය ගියේය.



අ.පි.බ.

රාම් හට අනතුර නිසා ලද තුවාලවලින් හටගත් පූර්ව පිළිකා සහිත සෛල (Pre-Cancerous cells) රාම්ගේ තොල් ප්‍රදේශයේ තිබූ බව වෛද්‍ය වාර්තා සඳහන් කළේය.

බීමත් රියදුරා සතු වගකීමේ ප්‍රමාණය නිර්ණය කිරීමට යොදාගත හැකි රීතීන් සහ පරීක්ෂණ ආශ්‍රයෙන්, මෙකී විසඳිය යුතු කරුණු සාකච්ඡා කරන්න.

04. පනස්වියැති සුසීලා, කීර්තිමත් පෞද්ගලික ආයතනයක ගණකාධිකාරිවරියකි. ඉතා ප්‍රසිද්ධ රූපලාවන්‍ය ද්‍රව්‍ය නිෂ්පාදකයන් වන 'Lovely Henna', විසින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද කේශාලේපනයන් ඇය තෝරා ගනියි. එය මිලදී ගැනීමට ප්‍රථමව, ඇය එම කේශාලේපනය භාවිතය සඳහා වන උපදෙස් පිළිබඳව කියවා තිබුණි.

ඇය තම නිවසේදී, එම නිෂ්පාදනය ආලේප කළ විටදී, ඇගේ හිස්කබලෙහි සම ඉදිමෙන්නට පටන්ගත් අතර, ඉන්පසුව ඇය සිහිසුන් විය. ඇය දැඩි අසාත්මිකතාවයකට ලක්ව තිබූ බව සහ ඇයට සති තුනක කාලයක් රෝහල්ගතව සිටීමට සිදුවූ බව වෛද්‍යවරු අනාවරණය කර ගත්හ.

'Lovely Henna' නිෂ්පාදකයන්ට එරෙහිව නඩු පැවරීමට සුසීලා අපේක්ෂා කරයි. ඇයට උපදෙස් දෙන්න.

05. "සාමාන්‍ය රීතියක් වශයෙන්, ඉහළ මට්ටමක අවදානම් සහගත ක්‍රියාන්විත සම්බන්ධව යථාර්ථ වගකීම පැවරීම, අධිකරණ විසින් සිදුකරනවාට වඩා, පාර්ලිමේන්තුව විසින් පැවරීම, වඩාත් උචිතවන බවට, වන මතයට මම කැමැත්තෙමි."

(Lord Goff in Cambridge Water Co. Ltd. V. Eastern Counties Leather PLC) [1994] 2 AC 264 [HL]

රයිලන්ඩ්ස් එ. ෆ්ලෙචර් හි විෂය පථය සහ අදාළත්වය පටුකිරීම පිණිස, අධිකරණ විසින් හඳුන්වා දෙන ලද අවශ්‍යතාවයන් සහ සීමාවන් සාකච්ඡා කරන්න. ඔබගේ සාකච්ඡාව, ශ්‍රී ලංකාවේ අධිකරණමය ආකල්පය සහ අවම වශයෙන් තවත් එක් අධිකරණ බල ප්‍රදේශයක් (Jurisdiction) වෙත අවධානයට යොමු කරමින් කරන ලද විග්‍රහයක් මත පදනම් විය යුතුය.

06. කීර්තිමත් වේගපන්දු යවන්නකු වූ සංජයට අන්තර්ජාතික ක්‍රිකට් තරඟයක් අතරතුරදී කශේරුකාවේ පීඩාවක් හට ගත්තේය. වේදනාව දිගින් දිගටම පැවතීම නිසා, සංජය විකලාංග ශෛල්‍ය වෛද්‍යවරයකු වන වෛද්‍ය සිල්වාගේ උපදෙස් පැතීය. වෛද්‍ය හමුවේදී, සංජයගේ තත්ත්වය, ආබාධිත තත්ත්වයක් දක්වා වර්ධනය විය හැකි බව නිර්ණය කරන වෛද්‍ය සිල්වා, ප්‍රමාද නොවී කොඳු ඇට පේළිය හා සම්බන්ධිත ශෛල්‍ය කර්මයක් කළයුතු බවට සංජයට උපදෙස් දුනි. විදේශ සංචාරයක් සඳහා යාමට සිදුවන හෙයින්, ශෛල්‍ය කර්මය සඳහා තමාට සහභාගි විය නොහැකි බව ප්‍රකාශ කරමින්, වෛද්‍ය සිල්වා, සංජයව වෛද්‍ය එල්සන් වෙත යොමු කළේය. ශෛල්‍ය කර්මයෙහි ඇති අවදානම පිළිබඳව සංජය වෛද්‍ය සිල්වාගෙන් ප්‍රශ්න කළ අවස්ථාවේ දී, සංජය, ස්ථිර ආබාධිත තත්ත්වයට පත්වීමට 10% ක සම්භාවිතාවයක් පවතින බව වෛද්‍යවරයා ප්‍රකාශ කළේය. සංජය, එවිට වෛද්‍ය එල්සන්ගෙන් උපදෙස් පැවතුවද, එම ශෛල්‍යකර්මයේ අවදානම පිළිබඳව ප්‍රශ්නවලට පිළිතුරුදීම ප්‍රතික්ෂේප කළ ඔහු, නිරෝගී රෝහලේදී ශෛල්‍යකර්මය සිදු කිරීම සඳහා සංජයගේ කැමැත්ත ලබා ගත්තේය.

වෛද්‍ය එල්සන්, නොදැනුවත්වම භාවිතා කොට තිබුණේ, ජීවාණුහරණය නොකරන ලද සැත්කම් උපකරණ වේ. එම ශෛල්‍යකර්මය අසාර්ථක විය. මීට අමතරව, අවසාන ප්‍රතිඵලයක් වශයෙන් සංජය මොළයෙහි පූර්ණ අකර්මණ්‍යතාවයකට පත්කරමින් ආසාදන තත්ත්වයකට (Infection) ගොදුරුවිය.

සංජය සමඟ, නිරතුරුවම සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ අදහස් ප්‍රකාශ කරගත්, ඔහු කෙරෙහි අසීමිත ලෙස බැඳුණු රසිකාවියක වන නිලානි, ඇයට එම ක්‍රීඩකයා දැකගැනීමට අවස්ථාවක් ලබාදෙන ලෙසට රෝහලෙන් බලකර ඉල්ලා සිටින ලදී. ඔහුගේ අකර්මණ්‍යතාවය දැකීමෙන් පසු, නිලානි දැඩි කම්පනයට පත්වූ අතර නිලානිගේ තත්ත්වය, උග්‍රශෝකය නිසා හටගන්නා ව්‍යාධියක් (Pathological Grief) දක්වා වර්ධනය වී ඇති බව, ඇගේ දෙමාපියෝ දැන් ප්‍රකාශ කර සිටිති.

නඩු පැවරීමට යටත් කළ හැකි, සියලුම විත්තිකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සංජයට මෙන්ම නිලානිගේ දෙමාපියන්ට ද අවශ්‍යව ඇත. උපදෙස් දෙන්න.

*විකලාංග ශෛල්‍ය වෛද්‍යවරු (Orthopaedic Surgeons), අස්ථි පද්ධතියට බලපෑම් කරන තුවාල සහ රෝග සඳහා ප්‍රතිකාර කරති.

07. ප්‍රධාන සිංහල පුවත් ප්‍රකාශකයකු වන "දවස", පුවත්පතෙහි මුල් පිටුවෙහි තීරු වශයෙන් ප්‍රධාන පුවත් දෙකක් වාර්තා කළේය. ඉන් එක කථා පුවතක, කම්කරු. පක්ෂයේ ප්‍රධාන දේශපාලනඥයකු වන සෑම්, පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබාගත් තම බෑනාගේ උපාධි උත්සවයට සහභාගිවීම පිළිබඳව වාර්තා කළේය. අනෙක් පුවතෙහි, කම්කරු පක්ෂය විසින් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට එරෙහිව සංවිධානය කොට තිබූ ජනතා ව්‍යාපාරයක සෑම් මූලාසනයේ අසුන්ගෙන, වෙනත් සාමාජිකයකු විසින් "පුද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳව අපහාසාත්මක අදහස් ඉදිරිපත් කිරීමකට සවන්දෙමින් සිටින ආකාරය සහිත සෑම්ගේ ඡායාරූපයක්, එම ලිපියෙහි සිරස්තලය ලෙස උපුටා දක්වා තිබුණි. මෙම පුවත්පත් ලිපිදෙක එකිනෙකට සහසම්බන්ධතාවයක් එල නොකළ ද, ඒවා එහි පළමු පිටුවෙහි "දවසේ පුවත" තීරුව තුළ එකට ඉස්මතු කොට තිබුණි. මෙම කතා පුවත් එක සමාන ආකෘතියෙන් යුතුව, "දවස" පුවත්පතෙහි, සහෝදර පුවත්පතක් වන "හවස" නම් අන්තර්ජාල පුවත්පතෙහි ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත්කර තිබුණි.

සතියකට පසුව, මෙම කතා පුවත එල කරන ලද පුවත්පතේ පළමු පිටුව, පුවත්පතෙහි එක් ප්‍රවර්ධන රූපවාහිනී වෙළඳ දැන්වීමකදී, පුවත්පත "සාධාරණ සහ නිර්භය" ජනමාධ්‍යකරණය ලෙස විදහා දැක්වීමට යොදා ගනු ලැබීය. අදාළ වෙළඳ දැන්වීම පසුබිම් හඬද සහිතව තත්පර 20 ක කාලයක් නිශ්චල ඡායාරූපයක් ලෙස තිරයේ දිස්විය. මෙකී එලකිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ සිදුවීම්වලින් අසතුටට පත් සෑම්, "දවස" හා "හවස" පුවත්පත්වලට එරෙහිව අපහාසය යටතේ නඩු පැවරීමට අදහස් කරයි.

අධිකරණයේ දී, විත්ති පාර්ශවය ආවරණය කිරීම සඳහා පෙනී සිටින ලෙසට මව් සමාගම ඔබගෙන් ඉල්ලා සිටියි. දවස හා හවස විසින්, ඔවුන්ගේ නඩුවට සහාය පිණිස භාවිතා කළ හැකි තර්කනයන් කෙටුම්පත් කරන්න.

එහිදී අදාළ නෛතික මූලධර්ම සහ නඩු තීන්දු පිළිබඳව අවධානය යොමු කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

○o○o○o○o○o○o○o○o